# Asia Commune

www.asiacommune.org



Asiacommune22@gmail.com
Revolutionaryfrontsouthasia@gmail.com





## දකුණු ආසියාවේ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ආසියා කොමියුනයේ ප්‍රකාශය

ආසියා කොමියුනය මෙම සටහන ලියන්නේ 2024 නොවැම්බර් මස 27 වන දින සවස් භාගයේය. ලෝකයේ සෑම කලාපයකම තත්වය ඉතාම තීරනාත්මකයි. නැගිටීම ප්‍රමාද කිරීම මාරාන්තික බව දැන් සම්පූර්ණයෙන්ම පැහැදිලිය.

ආසියා කොමියුනය එහි මුළු ශක්තියෙන්ම ඔබගෙන් ඉල්ලා සිටින්නේ ලෝකයේ සෑම කොණකම ඇති අන්තවාදි තත්වයන්, යුධ භීතිකාවන් තේරුම් ගන්නා ලෙසය. දැනට පවතින අර්බුදය සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු , සමුළු, ජනප්‍රිය දේශපාලන පෙරමුණු, පාර්ලිමේන්තුව, අධිකරණය සහ රාජ්‍ය නොවන සංවිධාන තුලින් විසදා ගත නොහැක. තව දුරටත් පවතින ක්‍රමය තුලින් විසඳුම් සෙවීම දරුණු මිලේච්ඡත්වයකට අත වැනීමකි.

නමුත් තනිකරම වැඩකරන ජනතාව සහ සෙසු පීඩිත ජන කොටස් මෙම ක්‍රමයට අභියෝග කිරීමට වැඩපිළිවෙලක් සහ විසඳුමක් සොයා ගත යුතුය.

විසඳුමක් සෙවීම සඳහා පහත සඳහන් මූලධර්ම වලට අප ගරු කළ යුතු අතරම එය අවබෝධ කර ගත යුතුය.

1. ඓතිහාසික භෞතිකවාදයේ මාක්ස්වාදී පදනම.
2. ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයක් නිර්මාණය කිරීමට දේශපාලන නායකත්වයක් සහ සංවිධානයක්.
3. වර්තමානයේ ධනවාදය ක්‍රියාත්මක වන ආකාරය ජනතාව වෙත සංනිවේදනය කිරීමට අපට මෙවලමක් අවශ්‍යය වේ.
4. දකුණු ආසියාවේ වැඩ කරන ජනතාව අතර අන්තර් සම්බන්ධීකරන මණ්ඩලයක් ඇති කිරීම.
5. දකුණු ආසියාවේ වැඩකරන ජනතාවගේ එක්සත් සංවිධානයක් මගින් ඉන්දියාවේ හෝ වෙනත් ඕනෑම රටක විප්ලවීය තත්ත්වය සුරක්ෂිත කළ හැකි බව අප තේරුම් ගත යුතුය.
6. සමාජවාදී අදහස් කතා කිරීමෙන් හෝ ලිවීමෙන් පමනක් දකුණු ආසියාවේ ධනවාදය පරාජය කල නොහැක. ඒ සඳහා බ්‍රිතාන්‍යයන්, පෘතුගීසින් සහ ලංදේසීන් බෙදා වෙන් කල දකුණු ආසියාවේ ජනතාව නැවත එක් කල යුතුය. එම නිසා දැනට පවතින දේශසීමා ඉවත් කිරීමට අපි යෝජනා කරමු.

7. ධනේශ්වර ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ පද්ධති වල ණය මත යැපෙන ක්‍රමය ප්‍රතික්ෂේප කල යුතුය. ඒ සමගම වැඩකරන ජනතාවගේ ශක්තිය මත නව කලාපීය මූල්‍ය ක්‍රමයක් සහ නව ආර්ථික මාදිලියක් අත්හදා බැලිය යුතුය.

8. දකුණු ආසියාවේ සමස්ථ ජනගනය බිලියන 2.04 කි. මෙම ජනගහනයෙන් 78.8 % ක් ම දරිද්‍රතා මට්ටමේ සිටී. ඉදිරි කාලයේදී මෙම තත්වය තවත් උග්‍ර වීමට ඉඩ ඇත. එබැවින් මෙම ජනතාව පන්ති අරගලය දෙසට යොමු කල යුතුය.

   ඒ සදහා මුළු කලාපයම වෙලාගෙන ඇති ජාතිවාදය, ආගම්වාදය සහ කුලවාදය පරාජය කල යුතුය. විශේෂයෙන්ම ඉන්දියාව වෙලාගෙන පවතින හින්දු අන්තවාදී ෆැසිස්ට්වාදී පාලනය පරාජය කල යුතුය. ඉන්දියානු ධනවාදි ආගම්වාදි ක්‍රමය පෙරලා දැම්මට මුළු කලාපයේම වැඩකරන ජනතාව එක්සත් කල යුතුය.

9. බංගලාදේශය, පකිස්ථානය සහ ඇෆ්ගනිස්ථානය දරුණු මුස්ලිම් අන්තවාදයේ බලපෑමට හසු වි ඇත. එම අන්තවාදයෙන් මිදීමට මුළු මහත් දකුණු ආසියාවම එකට අත්වැල් බැඳගත යුතුය.

   ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ අන්තවාදයට එරෙහිව දමිළ මුස්ලිම් ජනතාව ආරක්ෂා කීරීමට දකුණු ආසියාව එක් විය යුතුය.

10. නේපාලයේ කොමියුනිස්ට් පක්ෂ එක් වී ඇති කර ගත් පාලන ක්‍රමය අප විසින් විමර්ශණය කල යුතුය. නේපාලය දකුණු ආසියවේ දුප්පත්ම රට බවට පත් වී ඇත. එම කොමියුනිස්ට් ව්‍යාපාර වල සිටින සහෝදරවරුන් මෙම තත්වය ගැන ඉතා ගැඹුරින් සිතිය යුතුය.

අද ආසියා කොමියුනය යෝජනා කරන්නේ මුළු දකුණු ආසියා කලාපයටම එකම විප්ලවිය දේශපාලන පෙරමුණකි.

1. දකුණු ආසියානු ජනතාවගේ සමානාත්මතාවය සහ ස්වෛරීභාවය.

2. වෙන්වීම සහ ස්වාධීන රාජ්‍යයක් පිහිටුවීම දක්වාම ස්වයං නිර්ණය සඳහා දකුණු ආසියානු ජනතාවට ඇති අයිතිය පිළිගැනීම. එසේ පිළිගැනීම එක්සත් වීමට ඇති මාර්ගය බවත් අපි විශ්වාස කරමු.

3. ජාතින්ට සහ ආගම් වලට කිසිදු විශේෂ වරප්‍රසාදයක් නොදිය යුතු බව අපි ප්‍රකාශ කරමු.

4. දකුණු ආසියාවේ භූමියේ ජීවත් වන සියලුම සුළු ජාතීන් සහ ජනවාර්ගික කණ්ඩායම්වල නිදහස් සංවර්ධනය.

ඉහත සදහන් කරුණු ජය ගැනිමට සංවිධානය විය යුතු බව අපි දැඩි සේ ප්‍රකාශ කරමු. ඒ වෙනුවෙන් ඉන්දියාව, බංගලාදේශය, පකිස්ථානය, ශ්‍රී ලංකාව , නේපාලය, ඇෆ්ගනිස්ථානය, භූතානය සහ මාලදිවයින යන රටවල් නියෝජනය කරමින් අපි කලාපිය දේශපාලන මණ්ඩලයක් පත් කර ගනිමු.

## අපි ප්‍රායෝගිකව බංග්ලාදේශයෙන් පටන් ගනිමු

අද බංග්ලාදේශයේ තත්ත්වය ඉතා බිහිසුණු සහ තීරණාත්මකය. මෑතක එහි ශිෂ්‍ය ව්‍යාපාරයේ දැවැන්ත නැඟිටීමක් ඇති විය. එය ආරම්භ වූයේ 2024 ජූනි මාසයේය.

අවසානයේ එම ශිෂ්‍ය ව්‍යාපාරයේ නායකයන් අන්තර්වාර රජයේ  ප්‍රධානියා ලෙස ආචාර්ය මුහම්මද් යුනුස් පත් කර ගන්නා ලදි. ගෝලීය ධනවාදයේ නියෝජිතයකු වන යූනුස් අද වන විට සම්පූර්ණයෙන්ම ආසාර්ථක වී ඇත. ඔහු සිවිල් වැසියන් අත් අඩංගුවට ගැනීමට හමුදාවට බලය ලබා දී ඇත. දිගින් දිගටම මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් ශක්තිමත් වී ඇත. බංගලාදේශය ජිහාඩ්වාදයේ දිශාවට ඇදෙමින් පවතී.

මෙම තත්ත්වය තුළ බංග්ලාදේශයේ ව්‍යාජ වම සහ අනෙකුත් වාමාංශිකයන් කටයුතු කරන්නේ හඬක් නැති නරඹන්නන් ලෙසය. ශ්‍රී ලංකාවේ මෙන්ම බංගලාදේශයේ ද ව්‍යාජ වම අවසාන වී ඇත.

වාසනාවකට මෙන් එහි සටන්කාමී වාමාංශික කණ්ඩායම් කිහිපයක් අලුතින් සිතීමට පටන්ගෙන ඇත. ඒ අතර ABUL HOSSAIN සහෝදරයා සහ තවත්  කණ්ඩායම් කිහිපයක් එක්සත් වී බංගලාදේශයේ නව වාමාංශික ව්‍යාපාරය ගොඩනැගීමට ඉදිරිපත් වී ඇත. අපි අලුත් විප්ලවීය පරිච්ජේදයක් බංගලාදේශයෙන් ආරම්භ කරමු.

The Asia Commune International Bureau

**(ඉන්දියාව, බංගලාදේශය, පකිස්ථානය, ශ්‍රී ලංකාව , නේපාලය, ඇෆ්ගනිස්ථානය, භූතානය සහ මාලදිවයින)**